---

# අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

## ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 20 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 26 දිනසභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ ට්‍රැක්ටරයක වටිනාකම වූ රු.1,379,000 ක් ලීබඩු උපකරණවල වටිනාකම වූ රු.108,570 ක් හා වටිනාකම් තක්සේරු කර නොතිබූ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක, ස්කෑනර් යන්ත්‍රයක, ඡායා පිටපත් යන්ත්‍රයක, මුද්‍රණ යන්ත්‍රයක හා පරිගණක යන්ත්‍රයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) මග නැගුම හා ගම නැගුම වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 14 ක් වෙනුවෙන් ලැබියයුතු රු.7,252,250 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම්**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.167,698,235 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 **<u>නොසැසඳු පාලන ගිණුම්</u>**

ගිණුම් විෂයයන් 5 කට අදාළ ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.490,218,919 ක්වු අතර, ඒවාට අදාළ උපයෝගී ලේඛන/වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු.482,088,444 ක් වුයෙන් රු.8,130,475 ක වෙනසක් නිරීක්ෂණය විය.

2. **<u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵලය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.29,872,781 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.5,824,665 ක් විය.

2.2 **<u>මූල්‍ය පාලනය</u>**

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2001 හා 2003 වර්ෂ වලදී බැංකුවෙන් හර කිරීම් කර තිබූ රු.40,599 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු.47,850 ක් ව උපලබ්ධි නොවු චෙක්පත් 2 ක් සම්බන්ධව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3 **<u>ආදායම් පරිපාලනය</u>**

2.3.1 **<u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය ලැබීම් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000" | රු.000" | රු.000" |
| (i) | වරිපනම් බදු | 12,856 | 12,736 | 27,642 |
| (ii) | බදුකුලී | 4,632 | 4,770 | 298 |
| (iii) | වෙනත් ආදායම් | 5,409 | 6,064 | 12,748 |

2.3.2 **<u>හිඟහිටි වරිපනම් බදු</u>**

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.27,413,521 ක් වු අතර, පසුගිය වර්ෂ වලින් අයවියයුතු ශේෂය රු.19,415,462 ක් විය. සමාලෝචිත වර්ෂය තුල වර්ෂයක් ඉක්ම වූ හිඟහිටි වරිපනම් බදු අයකරගැනීමේ ප්‍රගතිය 29% ක්විය.

(ආ) එගොඩපොත උප කාර්යාල බල ප්‍රදේශයේ වසර 5 ඉක්මවූ හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.1,534,610 ක් වුවද, අයකර ගැනීමට ඵලදායි ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

2.3.3 **<u>කඩ කුලී</u>**

රාජ්‍ය ආයතන 4 කින් 2012 දෙසැම්බර් 31 දිනට අයනොවී පැවති කඩකුලී හිඟ ශේෂය රු.3,138,260 ක් විය.

2.4 **<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

2011 වර්ෂයේ මග නැගුම යටතේ රු.1,500,000 ක ප්‍රතිපාදන අනුමත කර තිබු ව්‍යාපෘති 3 ක කටයුතු සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබු අතර ගම නැගුම යටතේ සමාලෝචිත වර්ෂය තුළ රු.7,092,126 කට ඇස්තමේන්තු කර තිබූව්‍යාපෘති 7 කද වැඩ විගණිත දිනය වන විටත් අවසන් නොවී පැවතුණි.

3. **<u>පද්ධති හා පාලන</u>**

පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය